# ලලිත් ඇතුලත්මුදලි මහපොළ
# උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල

## තනතුරු පුරප්පාඩු

ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්වභාර අරමුදලෙහි පහත සඳහන් තනතුර සඳහා නිසි සුදුසුකම් සපුරන ලද ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

### කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන )III (තනතුරු - 03)

(අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී සිංහල /දෙමළ, ගණිතය, ඉංග්‍රීසි භාෂාව යන විෂයන් ඇතුළුව විෂයන් හතර (04) කට සම්මාන සාමාර්ථයන් සහිතව එක්වර විෂයන් හය (06) කින් සමත්ව තිබීම.

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර ( උසස් පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයන් තුනක් (03) සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර සමත්ව තිබීම.

(ඇ) පරිගණක සාක්ෂරතාවය සම්බන්ධයෙන් මාස 06 ක පාඨමාලාවක් හදාරා තිබීම.

**වැටුප් පරිමාණය :** MA 1-2 : රු. (46,220 - 10 X 540 + 7 X 630 +12 X 1,080X12 X1,280 - 84,350/-

2025.01.01. දිනට ගෙවන මුදල -රු.40,403/-, 2026.01.01. දිනට ගෙවන මුදල - රු.43,312/-, 2027.01.01 - රු.46,220/- (කළමනාකරණ සේවා චක්‍ර ලේඛ අංක 01/2025 )

EPF -15%, ETF - 3%, ජීවන වියදම් දීමනාව,

**වෙනත්:**
**සෑම අයදුම්කරුවෙක්ම :**

- වයස අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර අවුරුදු 45 ට නොවැඩි විය යුතු ය.
- තනතුරෙහි රාජකාරි ඉටු කිරීම සඳහා සුදුසු ශාරීරික සහ මානසික සෞඛ්‍යයකින් හෙබි අයෙකු විය යුතු අතර, දිවයිනෙහි ඕනෑම ප්‍රදේශයකට ස්ථාන මාරුවීමේ ලබාගැනීමේ හැකියාව නොමැති අතර, ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල ස්ථාපනය කර ඇති ස්ථානයේ සේවය කිරීමට හැකිවිය යුතුය. විශිෂ්ට චරිතයකින් හෙබි අයෙකු විය යුතුය. ඉංග්‍රීසි, සිංහල සහ දෙමළ භාෂා පිළිබඳ දැනුම හා ඉංග්‍රීසි, දෙමළ භාෂා, කතාකිරීමේ හැකියාව අමතර සුදුසුකමක් වශයෙන් සැලකේ.
- ලිඛිත පරීක්ෂණයක් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් තෝරාගැනීම සිදු කරනු ලැබේ.
- සම්පූර්ණ නම, උපන් දිනය, වයස, ජාතිය, අධ්‍යාපන සුදුසුකම්, පළපුරුද්ද සහ වෙනත් සඳහන් කළ යුතු තොරතුරු ඇතුලත් ඥාතීන් වන පුද්ගලන් දෙදෙනෙකුගේ නම් සහ ලිපින සහිත අයදුම්පත් අදාළ සහතිකවල පිටපත් සමග **සභාපති, ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල, 8 වන මහල, සතොස මහලේකම් ගොඩනැගිල්ල, අංක 27, වොක්ෂෝල් වීදිය, කොළඹ 02** ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් **2025/07/25** දිනට පෙර ලැබෙන සේ එවිය යුතුය. අයදුම්පත් බහා එවනු ලබන ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි අයදුම් කරන තනතුර සඳහන් කළ යුතුය.
- අයදුම්පත්‍ර කෙටි ලේඛනගත කිරීමේ අයිතිය මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල විසින් දරනු ලැබේ.
- අයදුම්පත්‍ර භාරගැනීමේ අවසන් දිනට පසුව ලැබෙන සහ අසම්පූර්ණ අයදුම්පත්‍ර භාරගනු නොලැබේ.

මේ සම්බන්ධයෙන් ඔබ විසින් වැය කරනු ලබන ගමන් වියදම් හෝ වෙනත් වියදම් මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල මගින් ප්‍රතිපූර්ණය කරනු නොලැබේ.

**සභාපති,**
**ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල,**
**8 වන මහල, සතොස මහලේකම් ගොඩනැගිල්ල, අංක 27, වොක්ෂෝල් වීදිය, කොළඹ 02.**
**දුරකථන : 0112685011, ෆැක්ස් : 0112675524, විද්‍යුත් තැපෑල : mahapolafinance@gmail.com**